# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1820/16 - 2013 ජූලි මස 24 වැනි බදාදා - 2013.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු නිවේදනය**

රේගු ආඥාපනතේ (235 අධිකාරය) 69 වගන්තිය යටතේ වන නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, රේගු ආඥාපනතේ (235 අධිකාරය) 69 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි මත්තල ග්‍රාමයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මත්තල රාජපක්ෂ ජාත්‍යාන්තර ගුවන් තොටුපළ පරිශ්‍රය බැඳුම්කර ගුදමක් විය යුතු බව සහ එහි සීමාවන් මෙහි උපලේඛන "අ", "ආ" සහ "ඇ" හි සඳහන් කර ඇති පරිදි විය යුතු බව මෙම නියමය මගින් නියෝග කර ප්‍රකාශයට පත් කරමි. මෙම ගුවන් තොටුපළේ සඳහන් සීමාවන් තුළ, ගුවන් මගීන් ගුවන් යානාවලට නංවා ගැනීම සහ ගුවන් යානාවලින් ගොඩබැස්සවීම, ගුවන් තැපැල් භාණ්ඩ සහ අනෙකුත් භාණ්ඩ ගුවන් යානාවලට පැටවීම, ගොඩබෑම, ගුදම්වල ගබඩා කිරීම, භාණ්ඩ ආනයනය, අපනයනය සහ ප්‍රති අපනයනය, ගුදම්ගත කළ භාණ්ඩ ගුදම්වලින් නැවත නිකුත් කිරීම සඳහා වන නීත්‍යානුකූල ගුවන් තොටුපළක් විය යුතු බව සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සීමාව තුළ එම ගුවන් තොටුපළ මායිම් සහ ප්‍රමාණයන් උපලේඛන "අ", "ආ" සහ "ඇ" හි සඳහන් පරිදි විය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2013ක් වූ ජූලි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.


1A - G 18022— 175 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එහි උපලේඛනයන් "අ", "ආ", "ඇ" යන්න වශයෙන් පහතින් විස්තර වේ.

**"අ" උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ තම්මැන්නාව, කැටන්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තම්මැන්නාව කුරුදාන ග්‍රාමයේ පිහිටි රජයේ මැනුම්පති විසින් 2012 මාර්තු මස සහ සමාංක ජාතික සිතියම් යොමුවේ ක්ෂේත්‍ර අංක EDM හ 2825, EDM හ 2950, අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක 03 අතුරු පිඹුරු අංක 369, පත්‍ර අංක 405 රේඛා චිත්‍ර අංක L/හ 519හි කැබලි අංක A 1408, 1409 සහ 1411 යන කැබලි සහ අතිරේක අංක 7 ක්ෂේත්‍ර පත්‍රයේ අවසාන ගම් පිඹුරු 575හි පිඹුරේ කැබලි අංක 177 ලෙස දක්වා ඇති බිම් කොටස් මැන සකස් කරන ලද බිම් කොටස්වල මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දෙසිය අසූඅටයි දශම හතයි තුනයි පහයි දෙකක් (288.7352 ha.) විශාල කුරුදාන කැලේ ඉගිනියන්ගහහේන, ජම්බුගහහේන සහ පලෙකුරුදාන වැල්කටුව නමැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් කැබලි සම්පූර්ණයෙන්ම වේ.

**A 1408 උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ තම්මැන්නාව, කැටන්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තම්මැන්නාව කුරුදාන ග්‍රාමයේ කුරුදාන කැලේ නමැති ඉඩමට රජයේ මැනුම්පති විසින් 2012 මාර්තු මස සහ සමාංක ජාතික සිතියම් යොමුවේ ක්ෂේත්‍ර අංක EDM හ 2825, EDM හ 2950, අවසාන හුලක්ෂාණාත්මක පිඹුරු අංක 03 අතුරු පිඹුරු අංක 369, පත්‍ර අංක 405 රේඛා චිත්‍ර අංක L/හ 519හි කැබලි අංක A1408ට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක A1413 ද, |
| නැගෙනහිරට | : | කැබලි අංක A1413 ද, |
| දකුණට | : | කැබලි අංක A1413 අවසාන ගම් පිඹුරු 575 කුරුදාන ද, |
| බටහිරට | : | අන්තිම ගම්පිඹුරු 575 කුරුදාන ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් හැටතුනයි දශම නවයයි තුනයි පහයි හතරක භූමිය ද, (63.9354 ha) |

***අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක 03 කැබලි අංක 1409ට මායිම් :***

| | | |
|---|---|---|
| උතුරට | : | අවසාන ගම් පිඹුරු අංක 575 කුරුදාන ද, |
| නැගෙනහිරට | : | කැබලි A 1413 ද, |
| දකුණට | : | කැබලි අංක A 1410 සහ A 1413 ද, |
| බටහිරට | : | කැබලි අංක A 1410 සහ අවසාන ගම් පිඹුරු 575හි කුරුදාන ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් හතරයි දශම එකයි තුනයි නවයයි හයක (4.1396 ha) භූමිය ද, |

***අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක 03 කැබලි අංක A 1411ට මායිම් :***

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක A 1412 සහ අවසාන ගම්පිඹුරු අංක 575 කුරුදාන ද, |
| නැගෙනහිරට | : | කැබලි අංක A 1410 ද, |
| දකුණට | : | කැබලි අංක A 1410 සහ A 1413 ද, |
| බටහිරට | : | කැබලි අංක A 1413, A 1412 සහ අවසාන ගම් පිඹුරේ 575 කුරුදාන ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දාහතයි දශම එකයි තුනයි තුනයි හතක් වන (17.1337 ha) මායිම් තුළ පිහිටි සියලු භූමි ප්‍රමාණය ද, |

මුළු එකතුව හෙක්ටයාර් අසූපහයි දශම දෙකයි බින්දුවයි අටයි අටක් වේ. (85.2088 ha)

**"ආ" උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, තම්මැන්නාව, කැටන්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තම්මැන්නාව කුරුදාන ග්‍රාමයේ කුරුදාන කැලේ, ඉගිනියන්ගහහේන, ජම්බුගහහේන, පලෙකුරුදාන වැල්කටුව ඉඩමේ පිහිටි රජයේ මැනුම්පති විසින් 2012 අප්‍රේල් මස 09 වැනි දින සමාංක ජාතික සිතියම් යොමුවේ ක්ෂේත්‍ර

අංක EDM හ 2825, EDM හ 2950, අවසාන ගම් පිඹුරු අංක 575 අතිරේක පිඹුරු අංක 07, පත්‍ර අංක 07 රේඛා චිත්‍ර අංක L/හ 520හි කැබලි අංක 177ට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 178 සහ අවසාන භූමි පිඹුරේ 3 පහළ මත්තල තම්මැන්නාව ද, |
| නැගෙනහිරට | : | අවසාන භූමි පිඹුර 3 පහළ මත්තල, තම්මැන්නාව සහ කැබලි අංක 179 ද, |
| දකුණට | : | අවසාන භූමි පිඹුර අංක 3හි කුරුදාන ද සහ කැබලි අංක 180 ද, |
| බටහිරට | : | කැබලි අංක 180, 181, 27, 28, 26C, 475B, 2, 8, 7, සහ 178 ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් දෙසිය තුනයි දශම පහයි දෙකයි හයයි හතරක් (203.5264 ha) වන භූමිය ද වේ. |

**"ඇ" උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාගම්පත්තුවේ පහළ මත්තල යන ගමේ පිහිටි රජයේ මැනුම්පති විසින් මැන සාදවා සකස් කරන ලද අංක 406 වැනි ක්ෂේත්‍ර පත්‍රයේ අවසාන භූමි පිඹුර අංක 03හි දක්වා ඇති A 1414 බිම් කොටසට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක A 1415 ද, |
| නැගෙනහිරට | : | කැබලි අංක A 1415 ද, |
| දකුණට | : | කැබලි අංක A 1415, A 1408 සහ අවසාන ගම් පිඹුර 575 කුරුදානද, |
| බටහිරට | : | කැබලි අංක A 1408, අවසාන ගම් පිඹුරේ 575 කුරුදාන සහ A 1415 යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් පන්සයි එකොළහයි දශම දෙකයි හයයි හරතයි අටක (511.2648 ha) විශාල ලුණුගම්වෙහෙර කැලේ නමැති ඉඩම් භූමිය ද මේ සමග වේ. |

ඉහත උපලේඛන අ, ආ, ඇ යන මුළු භූමි ප්‍රමාණයන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ රේගු ගුදම් සීමාවන් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

08-384

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.